<u>මහජනතාව වෙත කෙරෙන නිවේදනයයි.</u>

<u>ජනාධිපති නීතිඥයන් පත් කිරීම සම්බන්ධයෙන් වන මාර්ගෝපදේශ</u>

01. මෙම මාර්ගෝපදේශයන් ජනාධිපති නීතිඥයන් පත් කිරීම සම්බන්ධයෙන් මාර්ගෝපදේශයන් ලෙස හඳුන්වනු ලැබේ.

02. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33(2) (ඉ) ව්‍යවස්ථාව ප්‍රකාරව ජනාධිපතිවරයෙකු සතු බලතල ක්‍රියාත්මක කරමින් ජනාධිපති නීතිඥවරුන් පත් කිරීම සම්බන්ධව මෙම මාර්ගෝපදේශයන් අදාළ වන අතර රජයේ නීතිඥ නිලධාරීන් ලෙස සක්‍රීයව වෘත්තියේ යෙදෙන නිල තත්ත්වය පදනම් කර ගෙන ජනාධිපති නීතිඥවරුන් ලෙස පත්වන නිලධාරීන්ට මෙම මාර්ගෝපදේශයන් අදාළ නොවේ.

03. නීතිඥ වෘත්තියේ විශිෂ්ඨත්වයට පත් වී ඇති සහ පැවැත්මේ සහ වෘත්තිය කටයුතු පිළිබඳ අවංකභාවයෙහි උත්කෘෂ්ඨ තත්ත්වයක් පවත්වාගෙන යන ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන නමුත්, වෙනත් රටක පුරවැසිභාවයන් ලබා නොමැති නොතාරිස් වෘත්තියෙහි නොයෙදෙන සහ ලේඛනගත නීතිඥවරයෙක් වශයෙන් කටයුතු නොකරන ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයන් (මින් මතු නීතිඥවරයා, නීතිඥවරයන්, නීතිඥවරයෙකු හෝ නීතිඥවරයෙක් වශයෙන් හඳුන්වනු ලබන) ජනාධිපති නීතිඥවරයන් වශයෙන් පත් කිරීමට ජනාධිපතිවරයා විසින් සළකා බැලිය හැකිය.

04. පහත සඳහන් නිර්නායකයන් තෘප්ත කරන නීතිඥවරයෙකු, නීතිඥ වෘත්තියේ විශිෂ්ඨත්වයට පත් ව ඇති පුද්ගලයෙකු බවට සැළකිය හැකිය.

(අ) අවම වශයෙන් තම අයදුම්පත භාර දීමට ආසන්නතම වූ වසර 20 තුළ ශ්‍රී ලංකාවේ ඕනෑම අධිකරණයක ලේඛනගත නීතිඥවරයෙකුගේ උපදෙස් මත සක්‍රීය ලෙස නඩු මෙහෙයවමින් නීති වෘත්තියෙහි නියැලී සිටින නීතිඥවරයෙකු වීම සහ;

එහෙත්, අවු. 20 සේවා කාලය සපුරා නොමැති නමුත් අනෙකුත් සියලුම නිර්නායකයන් සපුරා ඇති සහ අවු. 15 ට වඩා සක්‍රීය සේවා කාලයක් සහිත ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයන්ටද අයදුම්පත් යොමු කල හැකිය.

(ආ) නීතියේ උන්නතිය උදෙසා නීති තර්ක තුළින් සක්‍රිය දායකත්වයක් ලබා දී ඇති නීතිඥවරයෙකු වීම සහ;

(ඇ) කණිෂ්ඨ නීතිඥයන් පුහුණු කිරීම සිදු කර ඇති නීතිඥයෙකු වීම.

05. පහත සඳහන් නිර්නායකයන් තෘප්ත කරන නීතිඥවරයෙකු, පැවැත්මේ සහ වෘත්තීය කටයුතු පිළිබඳ අවංකභාවයෙහි උත්කෘෂ්ඨ තත්ත්වයක් පවත්වාගෙන යන්නෙකු වශයෙන් සැලකිය හැක.

(අ) වෘත්තිමය විශ්වසනීයත්වය සහ ස්වාධීනත්වය උසස් ලෙස විදහා දැක්වීම සහ;

(ආ) ශ්‍රේෂ්ඨාධිකරණය විසින් හෝ ශ්‍රී ලංකා නීතිඥ සංගමය විසින් විනය නියෝගයකට ලක් කර නොමැති සහ අධිකරණයක් විසින් වෘත්තිමය පැහැර හැරීමක් හෝ අකටයුත්තක් සඳහා වරදකරු කර නොමැති සහ බුන්වත් නොවූ සහ අධිකරණයට අපහාස කිරීම සම්බන්ධයෙන් වරදකරු නොවූ සහ රථ වාහන ආඥා පනත යටතේ සුළු වරදකට හැර දේශීය හෝ විදේශීය අධිකරණයක් විසින් කිසිදු වරදකට වරදකරු කර නොමැති නීතිඥවරයෙකු වීම සහ;

(ඇ) යහපත් චරිතයකින් සහ කීර්තිනාමයකින් යුක්ත නීතිඥවරයෙකු වීම.

06. නීති ක්ෂේත්‍රයට අදාළව ජාත්‍යාන්තරව පිලිගත් සංගම්වල දරන ලද නිලතල සහ එමඟින් ලංකාවට කීර්තියක් අත් කර දී තිබීම සහ / හෝ නීතිඥවරයකු වශයෙන් ඔහු විසින්ම සිදු කරන ලද පර්යේෂණයන් පදනම් කර ගෙන ලියන ලද ලිපි ලේඛණ, ග්‍රන්ථ (උපුටා ගැනීම් නොවන) ප්‍රසිද්ධ කර තිබීම කෙරෙහිද අවධානයට ලක් කළ හැකිය.

07. අයදුම්පත් කැඳවීම

(අ) ජනාධිපති නීතිඥයන් පත් කිරීම සඳහා ජනාධිපතිතුමා විසින් අවශ්‍යතාවය පරිදි රජයේ ගැසට් නිවේදනයක් මගින් මෙහි සඳහන් සුදුසුකම් සහ නිර්නායකයන් සපුරා ඇති නීතිඥයන්ගෙන් අයදුම්පත් කැඳවීමට හැකිය.

(ආ) තම සුදුසුකම් සනාථ කරන ලේඛනවල සහතික පිටපත් සමග අයදුම්පතක් ජනාධිපති ලේකම් වෙත අදාළ ගැසට් පත්‍රයේ සඳහන් නියමිත දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් භාර ගනු නොලැබේ.

(ඇ) ලැබෙන ඉල්ලුම්පත් වල සඳහන් කරුණු වල නිරවද්‍යතාවය සහ අදාළ සුදුසුකම් හා නිර්නායකයන් පිළිබඳව පරීක්ෂා කර බැලීම සඳහා ජනාධිපතිවරයා විසින් ජනාධිපති ලේකම්ගේ ප්‍රධානත්වයෙන් යුත් ත්‍රිපුද්ගල කමිටුවක් පත් කරන අතර, එකී කමිටු වාර්තාව සළකා බැලීමෙන් අනතුරුව සුදුසු නීතිඥවරුන්, ජනාධිපති නීතිඥවරුන් ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන පරිදි පත් කිරීමට ජනාධිපතිවරයා කටයුතු කරනු ලැබේ.

08. ජනාධිපති නීතිඥවරයෙකු වශයෙන් පත් කිරීමට පෙර අයදුම්කරුවන්ගේ උචිතභාවය පිළිබඳව අග්‍රවිනිශ්චයකාරවරයාගේ හා/හෝ නීතිපතිවරයාගේ මතය ජනාධිපතිවරයාට විමසිය හැකිය.

09. අයදුම්කරු විසින් කෙලින්ම හෝ වක්‍රව තුන්වන පාර්ශවයක් මගින් අදාළ අයදුම්පත සම්බන්ධව හෝ ජනාධිපති නීතිඥවරයෙකු වශයෙන් පත් කිරිම සම්බන්ධව කිසිදු බලපෑමක් කිරිම නුසුදුසු කමක් ලෙස සලකනු ඇත.

10. යම් අයදුම්කරුවෙකු විසින් තම අයදුම්පත මගින් සාවද්‍ය තොරතුරු ලබා දීමක් හෝ කූට ලේඛන ඉදිරිපත් කිරිමක් හෝ කරුණු වසන් කිරිමක් සිදු කර ඇති විට එම ඉල්ලුම් පත්‍රය එනයින්ම ප්‍රතික්ෂේප වූ ලෙස සළකනු ලැබේ.

11. ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන පරිදි පත් කරනු ලබන සියලුම ජනාධිපති නීතිඥවරුන්ගේ නම් ගැසට් පත්‍රයේ පළ කළ යුතු අතර, එම තොරතුරු ජනාධිපති ලේකම් කාර්යාලය විසින් පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවියේ ද පළ කළ යුතුය.

ජනාධිපති ලේකම්
ජනාධිපති ලේකම් කාර්යාලය
ගාලුමුවදොර
කොළඹ 01